**සිංහල - 9 ශ්‍රේණිය**

# කර්තෘකාරක සහ කර්මකාරක වාක්‍ය

- **කර්තෘකාරක වාක්‍යවලදී ආඛ්‍යාතයෙන් කර්තෘ පදය උක්ත වෙයි.නැතහොත් ක්‍රියාව කරන්නේ කර්තෘම ය.**

උදා:

1. වෛද්‍යවරයා දැරිය සුවපත් කරයි.

(කර්තෘ කර්මය ආඛ්‍යාතය)

2. ගොවියා ගවයා බඳියි.

(කර්තෘ කර්මය ආඛ්‍යාතය)

- පළමු වාක්‍යයේ සුවපත් කරන්නේ වෛද්‍යවරයා ය.
- දෙවැනි වාක්‍යයේ ගවයා බඳින්නේ ගොවියා ය.

- **කර්මකාරක වාක්‍යයකදී ආඛ්‍යාතයෙන් උක්ත වන්නේ කර්ම පදයයි.මේ අනුව කර්මකාරක වාක්‍යයකදී,**

1.කර්තෘ අනුක්ත වෙයි.
2.විසින් යන නිපාත පදය එක්
වෙයි.
3.කර්ම පදය උක්ත වෙයි.
4.ක්‍රියා පදය ලද, ලබ, ධාතු යෙදී හෝ ඉබේ කෙරෙන ක්‍රියාවක් සේ යෙදෙයි.

උදා:

1.රියදුරා වාහනය පදවයි. (වර්තමාන)
රියදුරා විසින් වාහනය පදවනු ලබයි./පැදවෙයි.

2.කම්කරුවා බිරිඳ අමතයි. (වර්තමාන)
කම්කරුවා විසින් බිරිඳ අමතනු ලබයි./ඇමතෙයි.

3.ගොවීහු ගවයන් දක්කති.(වර්තමාන කාල බහුවචන)
ගොවීන් විසින් ගවයෝ දක්කනු ලබති./දැක්කෙති.

4.දරුවෝ දෙමාපියන් වැන්දෝ ය. (අතීත කාල බහුවචන)
දරුවන් විසින් දෙමාපියෝ වඳින ලදහ.

5.සිසුවා මිතුරා හමුවිය.( ඒකවචන අතීත කාල)
සිසුවා විසින් මිතුරා හමුවන ලදී.

ඉහත සටහන් ඔබේ සිංහල පොතට ඇතුළත් කරගෙන පහත අභ්‍යාසවලට පිළිතුරු ලියන්න.

- **කර්මකාරකයට හරවන්න**.

1.වෙළෙන්දා භාණ්ඩ විකුණයි.

2.වෙළෙන්දා භාණ්ඩ විකුණුවේ ය.

3.සිසු නායකයා සිසුන් අමතයි.

4.සිසු නායකයා සිසුන් ඇමතී ය.

5.මම මිතුරන් ප්‍රිය කරමි.

6.මම මිතුරන් ප්‍රිය කළෙමි.

7.කුරුල්ලා කූඩු තනයි.

8.කුරුල්ලා කූඩු තැනුවේ ය.

9.දරුවා මව නමදියි.

10.දරුවා මව නැමදී ය.

11.බල්ලා බත් කෑවේ ය.

12.ගිරවා අඹ කෑවේ ය.

13.ගුරුතුමා සිසුන් ඇමතුවේ ය.

14.දැරිය මල් නෙළුවා ය.

15.තාත්තා පුතු කැඳවී ය.

- **කර්තෘකාරකයට හරවන්න**.

1.වැද්දන් විසින් සතුන් අල්ලනු ලබති. /ඇල්ලෙති.

2.වැද්දන් විසින් සතුන් අල්ලන ලදහ.

3.ගුරුවරුන් විසින් සිසුහු යහමග යවන ලදහ.

4.කුරුල්ලන් විසින් පැටවු රකින ලදහ.

5.විදුහල්පතිවරුන් විසින් සිසුහු යහමග යවන ලදහ.

6.දඩයක්කරුවන් විසින් මුවෝ අල්ලන ලදහ.

7.කාන්තාවන් විසින් විසිතුරු මත්ස්‍යයෝ ඇති කරන ලදහ.

8.ගොවියන් විසින් සත්තු නාවන ලදහ.

9.රාජාලියන් විසින් කෘමීහු අල්ලන ලදහ.

10.සිසුන් විසින් ගුරුවරු අගය කරන ලදහ.

11.ගුරුවරයා විසින් පාඩම කියා දෙන ලදී.

12.ගොවියා විසින් වැට බඳින ලදී.

13.ගුරුතුමිය විසින් ශිෂ්‍යයෝ පසසන ලදහ.

14.මිතුරන් විසින් අනාථයෝ  සුරැකෙති.

15.අප විසින් දෙමාපියෝ පුදනු ලබති.

- ඔබේ සිංහල පෙළ පොතේ 111-113 දක්වා පිටු හොඳින් අධ්‍යයනය කොට 114 පිටුවෙහි ලිඛිත අභ්‍යාස සහ ප්‍රායෝගික අභ්‍යාස කරන්න

ජී.එල්.වත්සලා
ර/නිවි/සුමන ම.ම.වි.